6. "සඳමඬලේ සිට තරු මඬලේ සිට දිවැස් හෙළන පුතුනේ" ගීය ගායනා කරන්නේ අයිවෝ ඩෙනිස් මහතා ය. (          )

(21) පහත සඳහන් ආයතනවලින් සිදුවන සේවාවන් හඳුනාගෙන ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය වරහන තුළ යොදන්න.

A - නගර සභාව

B - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

C - ග්‍රාම නිලධාරී කාර්යාලය

1. උප්පැන්න මරණ සහතික ලියාපදිංචි කිරීම. (          )
2. ජාතික හැඳුනුම්පත් සකස් කිරීම සඳහා තොරතුරු ලබා ගැනීම. (          )
3. කුණු කසළ නිසි අයුරින් බැහැර කිරීම. (          )
4. වාහන ආදායම් බලපත්‍රය අලුත් කිරීම (          )
5. ඡන්ද පත්‍රිකා නිවෙස්වලට බෙදා හැරීම. (          )
6. ගෙවත්තේ ඇති කොස් ගසක් කැපීමට බලපත්‍රයක් ලබා දීම. (          )

ජාතික කොඩියේ රතු පැහැති පසුබිමෙන් අදහස් වන්නේ,

(i) ජාතික අභිමානය (ii) සිංහල ජාතිය (iii) සිංහල ජාතියේ නිර්භීතකම

රාජ්‍ය ලාංඡනයේ දක්නට නොලැබෙන දෙයක් වන්නේ,

(i) කඩුව අතින් ගත් සිංහයා (ii) පලාපෙති (iii) බෝ කොළ සතර

ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ,

(i) නා මල (ii) මානෙල් මල (iii) මානෙල්

උකුසු හාමි බොහෝම ඉහළ - මුව පැටියෙක් ඇල්ලුවා යන ක්‍රීඩාවේ රවුමේ මැද සිටින්නේ,

(i) උකුස්සා (ii) මුව පැටියා (iii) හා පැටියා

ශ්‍රී ලංකාව ඉංග්‍රීසින්ට මුළුමනින්ම යටත් වූ වර්ෂය වන්නේ,

(i) 1948 (ii) 1815 (iii) 1915

දමිල ජාතිකයින්ට අයත් ආහාර වර්ගයක් නොවන්නේ,

(i) තෝසේ (ii) ඉට්ලි (iii) ලම්ප්‍රයිස්

ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීමට පැමිණි විදේශීය ජාතීන් පැමිණි පිළිවෙළින් සඳහන් පිළිතුර වන්නේ,

(i) ඉංග්‍රීසීන්, පෘතුගීසීන්, ලන්දේසීන් (ii) පෘතුගීසීන්, ලන්දේසීන්, ඉංග්‍රිසීන්

(iii) ලන්දේසීන්, පෘතුගීසීන්, ඉංග්‍රිසීන්

උප්පැන්න සහතිකයේ පිටපතක් ලබා ගැනීම සඳහා යා යුතු වන්නේ,

(i) ප්‍රාදේශීය සභාවට ය (ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ය (iii) පොලිසියට ය

බට්ටා පැනීමේ ක්‍රීඩාවේ දී අඳිනු ලබන කොටු ගණන වන්නේ,

(i) 6 කි (ii) 7 කි (iii) 8 කි

නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති වන්නේ,

(i) ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා (ii) සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය

(iii) ඩී. එස්. සේනානායක මැතිතුමා

පොඩි කළ විට සුවඳ දැනෙන ශාක පත්‍රයක් වන්නේ,

(i) බිලිං (ii) කරපිංචා (iii) කොස්

ශක්තිමත් කඳක් ඇති ශාකයකි.

(i) කොස් (ii) කරපිංචා (iii) කතුරුමුරුංගා

# පිළිතුරු



**Answer**

# 2. තේමාව : අපි ලක් වැසියෝ

මිනිස් සමූහයක එකතුවෙන් සකස් වන සමාජයක් තුළ ජාති ආගම් යනාදි ලෙස විවිධ ජන කොටස් සහිත සමාජ අනුබණ්ඩ ඇති වේ. එවැනි ජන සමාජයක ජන කොටස් අතර සුරක්ෂිතතාව තහවුරු කිරීමට නම් ඒ ඒ ජන කොටස්වල සංස්කෘතික තත්ත්වයන් පිළිබඳ අවබෝධයකින් යුතු ව එම සංස්කෘතික තත්ත්වයන් අගය කරන අනන්‍යතායට ගරු කරන ඒවා රැක ගැනීමට දායක වන දේශීයත්වයට මුල් තැනක් දෙන සහජීවනයෙන් කටයුතු කරන ජන සමූහයක් නිර්මාණය විය යුතු ය. කුඩා කල සිට ම සිසුන්ට එම හුරුව ලබා දී එවැනි උත්තරීතර ජන සමාජයක් නිර්මාණය කිරීමට මෙම තේමාව සැලසුම් කොට ඇත.



**නිපුණතා :**

- ශ්‍රී ලාංකික සංස්කෘතික හා ජාතික උරුමයන්හි ලක්‍ෂණ විමර්ශනය කරමින් ඒවා රැක ගැනීමට දායක වෙයි.
- විවිධ ජන වර්ග, ඔවුන්ගේ සංස්කෘතික ලක්ෂණ හා අනන්‍යතාවන් අගය කරමින් ඒවා රැක ගැනීමට දායක වෙයි.
- රටේ නිදහස වෙනුවෙන් කැප කිරීම් සිදු කළ අය අගය කරමින් දේශාභිමානයෙන් යුතු ව කටයුතු කරයි.
- තමා ජීවත් වන ප්‍රදේශයේ විවිධ කටයුතු සඳහා සහය දක්වන ආයතන පිළිබඳ අවබෝධයක් ලබයි.
- ශ්‍රී ලාංකිකයන්ගේ විවිධ සංස්කෘතීන් පිළිබඳ අවබෝධයකින් යුතු ව දේශීයත්වයට මුල් තැන දෙමින් විවිධ නිර්මාණ කරයි.
- ලක්වැසියන් අතර භාවිත වන ක්‍රීඩාවල නියැළෙයි.
- ජාතික අභිමානය මතුවන ආකාරයට සෞන්දර්යාත්මක ඉදිරිපත් කිරීම් කරයි.

**ඉගෙනුම් පල :**

- ජාතික මෙන් ම අන්තර්ජාතික උත්සවවල දී ශ්‍රී ලාංකිකයකුගේ අනන්‍යතාව පිළිබිඹු කරන ඇඳුම් පැළඳුම් කතාබහ ආදියේ වැදගත්කම අවබෝධ කර ගනිමින් කටයුතු කරයි.
- ජාතික උරුම කිහිපයක් පිළිබඳ තොරතුරු ගවේෂණය කර ඒ පිළිබඳ ව විවිධ අයුරින් තොරතුරු ඉදිරිපත් කරයි.
- ජාතික උරුමයන් ආරක්ෂා කර ගැනීමේ ඇති වැදගත්කම පිළිබඳ ව විමසිලිමත් ව කටයුතු කරයි.
- ශ්‍රී ලාංකික සියලු ම ජන කොටස් අතර මිත්‍රශීලී ව කටයුතු කිරීමේ වැදගත්කම පිළිබඳ අවබෝධයෙන් යුතු ව ක්‍රියා කරයි.
- රටේ නිදහස වෙනුවෙන් කැප කිරීම් කළ විවිධ නායකයන්ගෙන් වූ සේවය අගය කරමින් වාර්තා කරයි.
- තමා ජීවත් වන ප්‍රදේශයේ ඇති පරිපාලන ආයතනයක් නිරීක්ෂණය කර එමගින් වන සේවය පිළිබඳ ව වාර්තා කරයි.
- තම ප්‍රදේශයට ආවේණික සැරසිලි පිළිබඳ ව සොයා බලා ඉන් කිහිපයක් නිර්මාණය කරයි.
- ශ්‍රී ලාංකිකයන් අතර භාවිත වන ජන ක්‍රීඩාවල යෙදෙයි.
- ශ්‍රී ලාංකිකයන් හා ශ්‍රී ලංකාවේ විභූතිය පිළිබඳ කියැවෙන ගීත ගායනා කරමින් ප්‍රකාශනාත්මක චලන ඉදිරිපත් කරයි.

- ශ්‍රී ලංකාවට කීර්තියක් අත් කර දුන් පුද්ගලයන්

| | | | |
|---|---|---|---|
| අර්ජුන රණතුංග මහතා | ආතර් සී ක්ලාක් මහතා | එදිරිවීර සරත්චන්ද්‍ර | සුසන්තිකා ජයසිංහ |



ලෙස්ටර් ජේම්ස් පීරිස් මහතා



රණතුංග කරුණානන්ද

ඩන්කන් වයිට්
ප්‍රදීප් සංජය
සරත් ගුණපාල
චන්ද්‍රා වික්‍රමසිංහ
මාර්ටින් වික්‍රමසිංහ
ඩබ් ඩී අමරදේව
ඒ.එස්.එන්.කුලසිංහ

- අපේ රටට ආවේණික දේවල්

ජාතික කොඩිය
ජාතික වෘක්ෂය
ජාතික පක්ෂියා
ජාතික ගීය
ජාතික පුෂ්පය
ජාතික ක්‍රීඩාව
රාජ්‍ය ලාංඡනය



- යම් ප්‍රදේශයකට ආවේණික දේවල්

ආහාර වර්ග, පාන වර්ග, ගස්වැල්, සත්තු, දේශගුණය, භූමියේ සුන්දරත්වය, කාලගුණය, අවේණික බෝග වර්ග, සුවිශේෂී ස්ථාන, ජන ක්‍රීඩා, සිරිත් විරිත්, ප්‍රාදේශීය භාෂා, සංස්කෘතිකාංග, විශේෂ ක්‍රීඩා...

- දේශීය අනන්‍යතාවය ප්‍රකාශ වන ගීත

> දකුණ නැගෙනහිර බටහිර උතුර ද එක කොඩියේ සෙවනේ
>
> (අයිවෝ ඩෙනිස්)
>
> අභිමානනීය වූ නවෝදයේ හිරු මෙහෙට උදයේ පායනවා
>
> (අයිවෝ ඩෙනිස්)
>
> මට මෑණී වගේ - මට පියා වගේ
> මට ආදර මගෙ ලංකා
>
> (රුවන් ශ්‍රීලාල් දල්පදාදු)
>
> සඳ මඬලේ සිට තරු මඬලේ සිට දිවැස් හෙළන පුතුනේ
>
> (මාලනී බුලත්සිංහල)

- අපට ආවේණික උරුමයන් ලෙස රැක ගත හැකි දේ.



සීගිරිය
මාතලේ දිස්ත්‍රික්කය
මධ්‍යම පළාත

* ඉපැරණි ස්ථාන/ගොඩනැගිලි , වෙහෙර විහාර
* ත්‍රිපිටකය
* දේශීය කැටයම් (ගොක්කොළ, ලී)
* නටබුන් (ඓතිහාසික වටිනාකමින් යුත් ගොඩනැගිලි)
* ගල් කැටයම් * මූර්ති * චිත්‍ර * පෙරහැර
* ගෘහභාණ්ඩ * ජනගීත/කවි/ක්‍රීඩා...ආදිය විස්තර කරන්න.
* රුකඩ * සටන් ක්‍රම (අංගම් පොර) * පුද පූජා
* සිරිත් විරිත්/ආගන්තුක සත්කාරය .

පිත්තල කැටයම්
(මහනුවර,නත්තර
මිපොත,යාපනය)



දේශීය මැණික්
රත්නපුර
බලංගොඩ



- දේශීය නිෂ්පාදන හා දේශීය සම්පත් අගය කිරීමේ ඇති වැදගත්කම

* තම රටේ අනන්‍යතාව ආරක්ෂා වීම
* රටට කීර්ති නාමයක් ගෙනදීම/ රටට වටිනාකමක්/අගයක් ලැබීම
* සංස්කෘතිය පරම්පරාවෙන් පරම්පරාවට දායාද කිරීම පහසු වීම
* මානසික සුවයක් අත්විඳීම
* සංස්කෘතික වටිනාකම දිනෙන් දින ඉහළ යාම

✓ දේශීය දේ පිළිබඳව අභිමානයක් ඇති වීම.
✓ ප්‍රදේශයේ රැකියා අවස්ථා බිහිවීම
✓ විදේශීය රටවලට ඇදී යන මුදල් ඉතිරි වීම
✓ ආහාර පාන වැනි නිෂ්පාදන නැවුම් බවින් යුතු වීම

- කලා උරුමයන් සහ සංස්කෘතික උරුමයන් විනාශ වී යාමට හේතු

  * නොසලකා හැරීම
  * හානිකර දේ කිරීම
  * අගය නොකිරීම
  * වටිනාකම් හඳුනා නොගැනීම
  * ඉදිරි පරම්පරාවට ඉගෙන ගැනීමට යොමු නොකිරීම හා නූතන පරම්පරාව ඒවා ඉගෙන ගැනීමට අකමැති වීම (විවිධ වෙදකම්, කලා කටයුතු)
  * විවිධ හස්ත කර්මාන්ත සඳහා භාවිත ද්‍රව්‍යවල මිල ඉහළ යාම (ඉදි, තල් කොළ වර්ග, පොල් ඉරටු, පන්, වේවැල්, ලාක්ෂා, . . .)
  * අවශ්‍ය සම්පත්වල හිඟකම

- අතීතයේ අපේ රටට කීර්තියක් ගෙන දුන් දේ

  * කෙම් ක්‍රම හා හෙළ වෙදකම් (දේශීය වෛද්‍ය ක්‍රම, යන්ත්‍ර මන්ත්‍ර) ඇසුරෙන් විවිධ රෝග සුව කිරීම.
  * ශාන්ති කර්ම ඇසුරෙන් විවිධ ලෙඩ සුව කිරීම
  * කැටයම් ඇසුරෙන් මඟුල් පෝරු, පිරිත් මණ්ඩප, තොරණ ඉදි කිරීම (ගොක් කොළ, ලී, කඩදාසි)
  * පිඟන් මැටි/මැටි, පල්ප් වැනි දේ ඇසුරෙන් අලංකාර භාණ්ඩ හා උපකරණ නිපදවීම
  * පැරණි දේශීය ආහාර වර්ග ඇසුරෙන් හා ජන ගී/ජන නැටුම්/ජන ක්‍රීඩා ආදිය ඇසුරෙන් අපේ සංස්කෘතික අනන්‍යතාව පිළිබිඹු වීම.
  * කළු ගලින්, මැටියෙන්, දැවයෙන් පිළිම, මූර්ති නෙළීම සිදු කිරීම
  * වෙස් මුහුණු නිර්මාණ, ලාක්ෂාවලින් විවිධ සියුම් නිර්මාණ කිරීම.

- එම නිසා රටේ පුරවැසියන් ලෙස දේශීය දේ, ජාතික වස්තූන්, ජාතික උරුමයන් ආරක්ෂා කිරීම අපේ වගකීමක් බව අවධාරණය කරන්න.
- කිසිදු අයකු විසින් ජාතික උරුමයන්ට කිසිදු හානියක් සිදු නොකිරීමටත්, එවැනි තත්ත්ව හමුවේ නීති හා ආරක්ෂක නිලධාරීන් දැනුම්වත් කොට අවශ්‍ය පියවර ගැනීමට අප හැමදෙනාට ම අයිතියක් ඇති බවත් තහවුරු කරන්න.

- අපේ රටේ ජීවත් වන විවිධ ජන කොටස්



✓ සිංහල
✓ බර්ගර්
✓ දෙමළ
✓ මුස්ලිම්
✓ මැලේ සහ ආදි වාසීන්

  * ශ්‍රීනි විභූෂිත ලංකා බැබළේ (ලතා වල්පොල)
  * ලෝකයක් නසන්නට රුදුරු අවි අත දරා (සුනිල් එදිරිසිංහ)

- විවිධ ජාතීන්ගේ ඇඳුම් පැළඳුම්
  1. සිංහල - ජාතික ඇඳුම, ඔසරිය, ළමා සාරිය, හැට්ටය
  2. දෙමළ - වේට්ටිය හා බැනියම, සාරිය හා හැට්ටය
  3. මුස්ලිම් - ජුබ්බා, තොප්පිය, හබායා, ඉජාභාජ්, පර්දාව
  4. බර්ගර් - යුරෝපීය ඇඳුම, කබාය, සපත්තු,ගවුම හා සාය
- විවිධ ජාතීන්ගේ ආහාර වර්ග
  1. සිංහල - කිරිබත්, කැවුම්, අග්ගලා, ආස්මි, හැලප, බත්
  2. දෙමළ - වඩේ, තෝසෙ, සාම්බාරු, ඉට්ලි, මුරුක්කු, ලඩ්ඩු
  3. මුස්ලිම් - බුරියානි, පරාටා, වටලප්පන්, බූන්දි, දෝසි, රට ඉඳි
  4. බර්ගර් - ලම්ප්රයිස්, කේක්, රෝල්ස්, පැටිස්, කට්ලට්,පාන්
- විවිධ ජාතීන්ගේ ආචාර ක්‍රම
  1. සිංහල - දෑත් එකතු කොට 'ආයුබෝවන්' කීම.
  2. දෙමළ - දෑත් එකතු කොට 'වණක්කම්' කීම.
  3. මුස්ලිම් - ආචාර කරමින් 'අස්සලාම් ආලෛක්කුම්' කීම.
  4. බර්ගර් - අතට අත දී 'හෙලෝ' කීම.
- විවිධ ජාතීන් අදහන ආගම්
  1. සිංහල - බෞද්ධ
  2. දෙමළ - හින්දු, ක්‍රිස්තියානි
  3. මුස්ලිම් - ඉස්ලාම්
  4. බර්ගර් - ක්‍රිස්තියානි
- විවිධ ආගම් වල පූජනීය ස්ථාන


| 1. බෞද්ධ | 2. ක්‍රිස්තියානි | 3. හින්දු | 4. ඉස්ලාම් |
|---|---|---|---|
|  |  |  |  |
| දළදා මාලිගාව (පන්සල) | ක්‍රිස්තියානි පල්ලිය | හින්දු කෝවිල | ඉස්ලාම් පල්ලිය (මස්ජිදය) |

- විවිධ ආගම් වල ආගමික නායකයින් සහ පූජකවරු
  1. බෞද්ධ - බුදුන් වහන්සේ - භික්ෂූන් වහන්සේ
  2. ක්‍රිස්තියානි - ජේසුස් වහන්සේ - ක්‍රිස්තියානි පියතුමා
  3. හින්දු - ශිව දෙවියන් - හින්දු පූජකතුමා/ පූසාරි
  4. ඉස්ලාම් - නබි නායක තුමා - ඉස්ලාම් පූජකතුමා

- විවිධ ආගම් වල ආගමික උත්සව

1. බෞද්ධ - කඨින පිංකම්, වෙසක්, පොසොන් සහ ඇසළ උත්සව, සංඝමිත්තා පෙරහැර, මිහිඳු පෙරහැර, කුලදරුවන් පැවදි කිරීම,
2. ක්‍රිස්තියානි - නත්තල්, පාස්කු, වාර්ෂික මංගල්‍යය, අළු බදාදා, මහ සිකුරාදා, මළවුන්ගේ දිනය.
3. හින්දු - තෛපොංගල් , මහා ශිව රාත්‍රි, නව රාත්‍රි දේව පූජාව, තේරු උත්සවය, හෝලි, දීපාවලි, වේල් උත්සවය
4. ඉස්ලාම් - හජ්ජි උත්සවය, රාමසාන් උත්සවය, මිලාදුන් නබි නායකතුමාගේ උත්සවය.

- විවිධ ආගම් වල ආගමික සංකේත



| | | | |
|---|---|---|---|
| බෞද්ධ | ක්‍රිස්තියානි | හින්දු | ඉස්ලාම් |
| ධර්ම චක්‍රය | කුරුසය | ත්‍රිශූලය | අඩසඳ හා තරුව |

- අපේ ජාතික වීරවරයන්

1. ගොංගාලේගොඩ බණ්ඩා / ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි......



නිදහස් සටනේ ප්‍රධානතම සෙන්පතියකු වූ ගොංගාලේගොඩ බණ්ඩාගේ මුල් නාමය වූයේ දාවිත් හෙවත් ඩේවිඩ් ය. අලුදෙණියේ බණ්ඩා, කපුරුබස්ති බණ්ඩලාගේ ඩේවිඩ්, දොන් පුල්ලේ වෙදරාල ආදී නම්වලින් හැඳින්වූයේ ද මොහු ම ය.

වර්ෂ 1843 පමණ කාලයේ දී මොහු බදුල්ල ප්‍රදේශයේ වාසය කර ඇති අතර එහි දී ජාතිමාමක, ජාත්‍යාභිමානී, නිර්භීත සිංහලයන් සමඟ එකතු වී ඉංග්‍රීසීන්ට විරුද්ධ ව කටයුතු කර ඇත. එනිසා ම මොහු රාජද්‍රෝහියකු හැටියට ඉංග්‍රීසි ආණ්ඩුව විසින් ප්‍රකාශයට පත් කරනු ලැබ තිබිණි.

තමා රාජසිංහ පවුලට නෑකම් ඇත්තකු බව ප්‍රකාශ කරමින් මහනුවර දළදා මාලිගාවේ වාසය කර ඇත. විදේශීය පාලනයට විරුද්ධව කටයුතු කිරීමේ දී එයට අවශ්‍ය පොදු ජන විශ්වාසය සහ සහයෝගය ලබා ගැනීම වැදගත් බව ඔහු විසින් අවබෝධ කරගෙන තිබුණි.

ඉංග්‍රීසීන් විසින් අය කරන ලද අසාධාරණ බදු අහෝසි කරවා ගැනීමට සිංහල ජනතාවට අවශ්‍ය විය. එසේ ම ඉංග්‍රීසි පාලකයන් ලංකාවෙන් පලවා හැරීමට සිංහලයන් එක් රොක් විය යුතු බව අවබෝධ කරගෙන තිබිණි. මේ අරගලයේ නායකත්වය සඳහා ගොංගාලේගොඩ බණ්ඩා පත්විය. වර්ෂ 1848 ජූලි මස 30 දින විශාල පිරිසකගේ කැමැත්ත සහ විහාරාධිපති ගිරානේගම ඉන්ද්‍රජෝති හිමිපාණන්ගේ අනුග්‍රහය ලැබිණි. ගරුතර මහා සංඝරත්නයේ ආශීර්වාදය ඇතිව ගොංගාලේගොඩ බණ්ඩා ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි නමින් තුන් සිංහලයේ ම රජු වශයෙන් ඔටුණු පළඳවා අභිෂේක කරන ලදි.

මහනුවර පැරැන්දුගල හා මාතලේ නගර ජයගෙන සිටින අවස්ථාවේ සිංහල සටන් නායකයන් අතර ඇති වූ භේද, සිංහලයාගේ යුද්ධායුධශක්තිය ප්‍රබල නොවීම ආදි හේතු නිසා සටන අඩපන විය. මෙය අවස්ථාව කරගත් ඉංග්‍රීසීන් සැඟවී සිටි ගොංගාලේගොඩ බණ්ඩා වර්ෂ 1848 නොවැම්බර් 14 දින යුද්ධාධිකරණය ඉදිරියට පමුණුවන ලදි. මෙහි දී ඉදිරිපත් කරන ලද පාපෝච්චාරණය නිසා මරණ දඬුවම ලිහිල් වී කසපහර 100ක් ගසා වර්ෂ 1849 ජනවාරි 01 දින මරණයට පත් විය. මහනුවර අභිෂේක ලත් රජු ලෙසත්, වර්ෂ 1848 විමුක්ති සටන සංවිධානය කර එය පොදු ජනතාව මගින් පණ පොවා මෙහෙයවූ වීරයකු ලෙසත් ගොංගාලේගොඩ බණ්ඩා යන නාමය ලංකා ඉතිහාසයෙහි නොමැකෙන අයුරින් සටහන් වී ඇත.

2. මොනරවිල කැප්පෙටිපොළ තුමා



ගොලහෙල කැප්පෙටිපොල සහ දෙල්වල එතනහාමිගේ පුත් කැප්පෙටිපොල දිසාව වූ අතර දුව ඇහැලේපොළ කුමාරිහාමි විය.

කැප්පෙටිපොල සිය පියාගේ ඇවෑමෙන් දළදා මාලිගයේ දියවඩන නිලමේ තනතුර හෙබවී ය. මුල සිට ම ඉංග්‍රීසි ජාතීන් සමග එකට එකතුව කටයුතු කළේ ය. මේ හේතුවෙන් ඌව වෙල්ලස්ස කැරැල්ල මර්ධනය කිරීම පිණිස ඉංග්‍රීසීන් විසින් යවන ලද්දේ කැප්පෙටිපොල දිසාවේ ය. නමුත් ඔහු ඌවේ ජනතාව සමඟ එක් වී රට ජාතිය බේරා ගැනීමට ඉංග්‍රීසීන්ට විරුද්ධව සටන් කොට ජය ගත්තේ ය. ඉංග්‍රීසි ජාතිකයන් මොල්ලිගොඩ දිසාවගේ සහයෙන් කැප්පෙටිපොළ දිසාව ඇතුළු බොහෝ දෙනෙක් සිරභාරයට ගත්තේ ය. ඔහු මරණයට මුහුණ දුන්නේ එඩිතරව ය. ඔහුගේ අවසන් ඉල්ලීම වූයේ තම ගෙල එක කඩුපහරින් ගසා දමන ලෙස ය. මේ මගින් එතුමාණන් තුළ පැවති වීරත්වය හා නිර්භීත බව පිළිබිඹු වේ.

පොන්නම්බලම් අරුණාචලම් මහතා, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා, පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, වීර පුරන් අප්පු, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, ගලගෙදර මොහොට්ටාල, කතරගම බස්නායක නිලමේ, බූටෑවේ රටේ රාළ, ඇහැලේපොළ අධිකාරම්,වාරියපොළ ශ්‍රී සුමංගල හිමියන්...

- විදේශ ආක්‍රමණිකයන් අප යටත් කිරීමට ගත් පියවර වෙනස් කිරීමට අපට කළ හැකි දේ

 * රටේ සශ්‍රීකත්වය නැති කිරීම සඳහා පුලුස්සා දැමූ 'මී' ගස් නැවත සිටුවා පස සරු කිරීම
 * භේද නොමැති ව සමගි ව වැඩ කිරීම
 * විදේශිකයන් විසින් අපට හුරුකළ මත්ද්‍රව්‍ය/මත් බීම හා දුම්වැටි වැනි වැරදි භාවිත වලින් ඈත් වීම.

 ▪ දේශීය කෑම බීම වලට හුරු වීම.
 උදා - තිරිඟු පිටි භාවිතය නතර කර දේශීය සහල් පරිබෝජනයට හුරු වීම.
 ▪ දේශීය වෙදකම/ හෙළ වෙදකම ප්‍රචලිත කිරීම.

- අපේ රට යටත් කර ගත් බටහිර ජාතීන්.

පෘතුගීසි (ක්‍රි.ව.1505) ලන්දේසි (ක්‍රි.ව.1658) ඉංග්‍රීසි (ක්‍රි.ව.1796)

- බටහිර ජාතීන් පිළිබඳව කියැවෙන ගීත

(පැරණි හටන් කාව්‍යවලින් උපුටා ගැනිණි)

1. යුද්දෙටත් ඇවිත් සිඳු පිට නැව් නැඟිලා පරංගී
 උත්තමුත් ඇවිත් කොළඹට ගොඩ බැසලා
 අන්දමත් සොඳයි කිසි බිසි ගාලා කොළඹ දී
 කම්පලක් නැතත් සෙනඟක් මරාදාලා

2. නොමදින් විකුම් පාලා
 සැදෙමින් යුදට ජය ලන්දේසින්
 සමඟින් එ ජනරාලා
 සමිඳුන් ගෙ භූමිපාලා
 සියසෙන් අතින් මියැ දී ගියෝ
 යුදයෙන් ඇනුම් කාලා

3. පත්තා එ ලන්දේසී //
 ගෙන්නා ඔවුන් පෙන්නා බලය
 පත්තා ලීය සිසී
 ගෙන්නාලා ඉංග්‍රීසි //
 දන්නා ඔවුන් ගෙන්නා බැඳල
 සෙන්නා අයට දාසී
 දුරලා සතුරු වියවුල් //
 කරලා දිගාවූ බිම ලා වැජඹී
 නිමලා එකින් එක දල්
 දැකලා මෙ අප මිහිපල් //
 සකලා සිරිත් එකලා නොකර
 මැඩලා තිසී වියවුල්

- බටහිර ජාතීන්ගෙන් අප රට නිදහස් කර ගැනීමට කැප වූ නායකයින්



ඩී. එස්. සේනානායක මහතා




මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි

පොන්නම්බලම් අරුණාචලම් මහතා, එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක මහතා, පූජ්‍ය හික්කඩුවේ ශ්‍රී සුමංගල හිමි, ආචාර්ය කොල්වින් ආර්. ද සිල්වා, ගලගෙදර මොහොට්ටාල, බූටෑවේ රටේ රාළ, ඇහැලේපොළ අධිකාරම්, වාරියපොළ ශ්‍රී සුමංගල හිමියන්....


- අපට ආවේණික විවිධ සැරසිලි සහ නිර්මාණ
    * අපතේ යන දේ ඇසුරෙන් සකස් කරන වෙසක් කූඩු
    * නත්තල් ගස් (විවිධ හැඩ අනුව සකස් කරන ලද)
    * නිර්මාණාත්මක ව ලියන කුරාණ වැකි
    * කෝලම් චිත්‍ර
    * මඟුල් පෝරු
    * ගොක්කොළ කැටයම්
    * වේවැල්/පොල්කටු රූක් ඇසුරෙන් කරන ලද කලාත්මක දෑ
    * වෙස් මුහුණු . . . ආදිය





......ගොක් කොළ කැටයම්......

- අපට සේවය සලසන පරිපාලන ආයතන
    - නගර සභාව
    - ප්‍රාදේශීය සභාව
    - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
    - පළාත් පාලන ආයතන
    - ලංකා විදුලිබල මණ්ඩලයට
    - ග්‍රාම නිළධාරී කාර්යාලය
- එම ආයතන වලින් අපට සිදුවන සේවාවන්
    * උප්පැන්න/මරණ සහතිකය ලියාපදිංචි කිරීම
    * ජාතික හැඳුනුම්පත් සකස් කිරීම සඳහා තොරතුරු ලබා දීම
    * ප්‍රාදේශීය/නාගරික මංමාවත් හා ගොඩනැඟිලි ඉදිකිරීම
    * පරිසරය පිරිසිදු කිරීම (කුණු කසළ නිසි අයුරින් බැහැර කිරීම)
    * පොදු අවශ්‍යතාවල දී සහාය දීම
    * ප්‍රදේශයේ ආරක්ෂාව පිළිබඳ සොයා බැලීම
    * රජයේ දේපළ සුරක්ෂිත කිරීම හා නඩත්තු කිරීම .




- එම ආයතන වල විවිධ තනතුරු දරන පුද්ගලයින්
    * ග්‍රාම නිලධාරි
    * පවුල් සෞඛ්‍ය සේවා නිලධාරි
    * කෘෂිකර්ම උපදේශක
    * සමෘද්ධි නිලධාරී
- බට්ටා..පැනීම/...කොටු..පැනීම. - යහළුවන් සමඟ එකතු වී ක්‍රීඩාව සිදු කරන්න. මෙහිදී ඉරි ඇල්ලීමෙන්, කුසපත් ඇදීමෙන් හෝ තුණ්ඩු දැමීමෙන් සිසුන් තරඟ වදින පිළිවෙළ තීරණය කළ හැකි අතර විවිධ හේතුව නිසා ක්‍රීඩකයන් දැවී යයි.
    * 7-8 කොටුවලට බට්ටා දමන විට දී 4-5 කොටුවට බට්ටා දමා පනින ආකාරයට කළ යුතු ය.
    * නිවැරදි ව අදාළ කොටුව තුළ බට්ටා විසි කිරීමට නොහැකි වීම දැවී යාමකි.
    * බට්ටා සිටින කොටුව පෑගීම දැවී යාමකි/ඉරි පෑගීම දැවී යාමකි. (තරඟයෙන් ඉවත් වීමකි.)
    * නිවැරදි පිළිවෙළින් පැනීමට නොහැකි වීම ද දැවී යාමකි.

## 05 ශ්‍රේණිය - පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්

## කාර්ය පත්‍රිකා අංක 02

**01. නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.**

1. ශ්‍රී ලංකාවේ පිහිටි ලෝක උරුමයක් තෝරන්න.
   i. ලංකාතිලක විහාරය ii. හෙනරත්ගොඩ රබර් ගස iii. සීගිරිය iv. පුංචි දඹදිව
2. දෙමළ ජන වර්ගයේ කාන්තාවන්ගේ අනන්‍යතාව සහතික කරන ඇඳුම වන්නේ මින් කුමක් ද?
   i. බුර්කාව හා පර්දාව ii. සාරිය හා හැට්ටය iii. ඔසරිය iv. බෝරිච්චි අත් හැට්ටය
3. මුස්ලිම් ජන වර්ගයේ කාන්තාවන්ගේ අනන්‍යතාව සහතික කරන ඇඳුම වන්නේ මින් කුමක් ද?
   i. ඔසරිය ii. පර්දාව iii. ගවුම iv. සාරිය
4. බර්ගර් ජන වර්ගයේ අනන්‍යතාව සහතික කරන ආහාර වර්ගය වන්නේ මින් කුමක් ද?
   i. බත් සමග ව්‍යාංජන ii. තෝසේ සමග සාම්බාරු iii. ලම්ප් රයිස් iv. කුකුල් මස් සමග බිරියානි
5. දළදා පෙරහැර හඳුන්වන වෙනත් නමකි,
   i. මිහිඳු පෙරහැර ii. කතරගම පෙරහැර iii. වෙල් පෙරහැර iv. ඇසළ පෙරහැර
6. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ,
   i. නා මල ii. නිල් මානෙල් මල iii. මානෙල් මල iv. ඕලු මල
7. ශ්‍රී ලංකාව බ්‍රිතාන්‍යයින්ට සම්පූර්ණයෙන්ම යටත් වු වර්ෂය කුමක් ද?
   i. 1948 ii. 1796 iii. 1815 iv. 1505
8. සියලුම බැතිමතුන් පොදුවේ වන්දනා කිරීමට යන ස්ථානයක් වන්නේ,
   i. ජේතවනාරාමය ii. සීගිරිය iii. කතරගම iv. අනුරාධපුරය
9. ''ස්වයංපෝෂිත රටක ඉර හඳ පවතින තෙක් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාවම වැජඹේවා '' යන සමස්ථ අදහස ඇත්තේ
   i. ජාතික කොඩිය ii. ජාතික ගීය iii. රාජ්‍ය ලාංඡනය iv. බෞද්ධ කොඩිය
10. පහත ආයතන අතරින් රාජ්‍ය ආයතනය තෝරන්න,
   i. පෞද්ගලික බැංකුව ii. සුපිරි වෙළඳසැල iii. ප්‍රාදේශීය සභාව iv. සම්පත් බැංකුව
11. ආචාර කිරීමේදී දෑත් එක කර ''වනක්කම්'' යන පදය භාවිතා කරන ජන වර්ගය මින් කුමක් ද?
   i. සිංහල ii. දෙමළ iii. මුස්ලිම් iv. බර්ගර්
12. අතීතයේ අප රට යටත් කර ගත් විදේශීය ජාතීන් අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   i. ඉංග්‍රීසි, ලන්දේසි, පෘතුග්‍රීසි ii. ලන්දේසි, ඉංග්‍රීසි, පෘතුග්‍රීසි
   iii. පෘතුග්‍රීසි, ලන්දේසි, ඉංග්‍රීසි iv. පෘතුග්‍රීසි, ඉංග්‍රීසි,ලන්දේසි
13. 1818 වසරේ ඌවේ ජනතාව සමග එක්ව ඉංග්‍රීසින්ට එරෙහිව කළ සටනට නායකත්වය දුන්නේ,
   i. ගොංගාලේගොඩ බංඩා ii. මොණරවිල කැප්පෙටිපොල දිශාව
   iii. මොල්ලිගොඩ දිශාව iv. මඩුගල්ලේ දිශාව
14. ජාතික හැඳුනුම්පත සකස් කිරීම සඳහා තොරතුරු ලබාදෙන අය වන්නේ මින් කවුරුන් ද?
   i. සමෘද්ධි නියාමක ii. ගොවි නියාමක iii. ග්‍රාම නිළධාරි iv. ප්‍රාදේශිය සභා සභාපති
15. ගොංගාලේගොඩ බංඩා යුද්ධාධිකරණයට පැමිණ වු වසර වන්නේ,
   i. 1796 ii. 1815 iii. 1948 iv. 1848
16. ශ්‍රී ලංකාවේ ලී කැටයම් සඳහා ප්‍රසිද්ධ ස්ථානයකි,
   i. ගඩලාදෙණිය විහාරය ii. ඇම්බැක්කේ දේවාලය iii. දළදා මාළිගාව iv. තිවංක පිළිම ගෙය
17. වෙස් මුහුණු කලාව හා රූකඩ සඳහා ප්‍රසිද්ධියක් උසුලයි.
   i. අම්බලංතොට ii. ඇම්බැක්කේ iii. අම්බලංගොඩ iv. මොරටුව
18. ගම් ප්‍රදේශය නියෝජනය කරන රාජ්‍ය නිලධාරියෙක් නොවන්නේ,
   i. ග්‍රාමනිලධාරි ii. පවුල් සෞඛ්‍ය සේවිකාව iii. සමෘද්ධි නිලධාරි iv. බැංකු කළමණාකරු
19. දේශිය කලාව හා සංස්කෘතික උරුමයන් ක්‍රමයෙන් අභාවයට යාමට හේතුවක් නොවන්නේ,
   i. වටිනාකම හඳුනා නොගැනීම ii. නොසලකා හැරීම
   iii. අගය නොකිරීම iv. ආවේණික වටිනාකම් තිබීම

20. ප්‍රාදේශිය සභාවෙන් ඉටුවන සේවාවක් නොවන්නේ,

i. ප්‍රදේශයේ කැලි කසල කළමණාකරණය
ii. උප්පැන්න මරණ සහතික ලියාපදිංචිය
iii. වරිපනම් බදු අයකර ගැනීම
iv. මාර්ග සඳහා විදුලි පහන් සවි කිරීම.

(ලකුණු 02 x 20 = 40)

## 02. වරහන් තුළින් තෝරා පහත ප්‍රශ්න සඳහා පිළිතුරු ලියන්න.

01. කෘෂිකාර්මික කටයුතු වලදී නිරන්තරයෙන් උපදෙස් ලබාදෙයි. ....කෘෂි....ව්‍යාප්ති....නිලධාරි....
02. ප්‍රදේශයේ අවශ්‍යතා පිළිබඳ කටයුතු කරන මහජන නියෝජිතයා. .....ප්‍රාදේශිය....සභා....සභාපති
03. දාවිත් හෙවත් ඩේවිඩ් , අලුදෙනියේ බණ්ඩා , දොන් පුල්ලේ වෙදරාල. ....ගොංගාලේගොඩ....බංඩා....
04. 1948 වසරේ නිදහස ලබාගැනීමට කැප වූ ජන නායකයෙකි. ...ඩී.එස්....සේනානායක....මහතා
05. රාජ්‍ය ලාංඡනයේ නිර්මාතෘ ලෙස සැලකේ. S.M....සෙනෙවිරත්න....මහතා
06. ඉස්ලාම් ආගමික උත්සවයකි. ........මිලාද්....උත්සවය..................
07. කතෝලික බැතිමතුන්ගේ උත්සව අවස්ථාවකි. ...කැරොල්....ගීත....සංදර්ශන...
08. රාජ්‍ය ලාංඡනයේ වී කරළින් නිරූපණය වේ. ස්වයංපෝෂිතබව....හා....සශ්‍රීකත්වය
09. ජාතික කොඩියේ රතු පැහැති පසුබිමෙන් නිරූපණය වේ. .........ජාතික....අභිමානය............
10. ජාතික කොඩියේ බෝකොළ සතරින් නිරූපණය වේ. .......සතර....බ්‍රහ්ම....විහරණ......

**(ගොංගාලේගොඩ බංඩා, S.M සෙනෙවිරත්න මහතා, කැරොල් ගීත සංදර්ශන, ඩී.එස්. සේනානායක මහතා, සතර බ්‍රහ්ම විහරණ, මිලාද් උත්සවය, , කෘෂි ව්‍යාප්ති නිලධාරි, ප්‍රාදේශිය සභා සභාපති, ස්වයංපෝෂිතබව හා සශ්‍රීකත්වය, ජාතික අභිමානය)**

(ලකුණු 02 x 10 = 20)

## 03. හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (×) ලකුණ ද යොදන්න.

01. රාජ්‍ය ලාංඡනයේ ඇති සංකේත ගණන 8 කි. (×)
02. මිහිඳු පෙරහැර බෞද්ධ ආගම මුල් කර ගත් සංස්කෘතික අංගයකි. (✓)
03. තැපැල් කාර්යාලය තුළ මුදල් තැන්පත් කිරීම කළ හැක. (×)
04. ප්‍රාදේශිය ලේකම් කාර්යාලයේ ප්‍රධානියා ප්‍රාදේශිය සභා සභාපති තුමාය. (✓)
05. ''නොමදින් විකුම් පාලා''මෙය රබන් පදයක මුල්පෙළ වේ. (×) (ලකුණු 01 x 5 = 05)

## 04. ආයතන ප්‍රධානියාගේ නිල නාමයට ගැළපෙන පිළිතුරු තෝරා යා කරන්න.

01. ප්‍රාදේශිය සභාව — A සාමාන්‍යාධිකාරි
02. ප්‍රාදේශිය ලේකම් කාර්යාලය — B විදුලි අධිකාරි
03. විදුලි බල මණ්ඩලය — C ස්ථානාධිපති
04. ජලප්‍රවාහන මණ්ඩලය — D ප්‍රාදේශිය ලේකම්
05. තැපැල් කාර්යාලය — E සභාපති

(ලකුණු 01 x 5 = 05)

## 05. කෙටි පිළිතුරු ලියන්න.

01. බට්ටා පැනීමේ ක්‍රීඩාව හඳුන්වන වෙනත් නමක් ලියන්න. .......කොටු....පැනීම.....................
02. ගොක්කොළ සැරසිලි දැවටීම සඳහා ගන්නා ශාකය නම් කරන්න. ...........කෙසෙල්....ගස.................
03. ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි නමින් රජ වූයේ කවුරුන් ද? .........ගොංගාලේගොඩ....බංඩා
04. පැරණි ගල් කැටයම් සඳහා ප්‍රසිද්ධ පළාත නම් කරන්න. ..........උතුරු....මැද....පළාත....
05. ලංකාවේ පැරණි සටන් කලාව හැඳින්වූ නම ලියන්න. .......අංගම්පොර...............................
06. සීගිරි චිත්‍ර ආසන්නයේ දැකිය හැකි අනෙක් වටිනා නිර්මාණය හඳුන්වන නම ලියන්න. .......කැටපත්....පවුර.................
07. දේවස්ථාන මංගල්‍යය පවත්වන්නේ කුමන බැතිමතුන් ද? ..........කතෝලික....බැතිමතුන්...............
08. රාජ්‍ය ලාංඡනයේ සෞභාග්‍ය හා පරිපූර්ණ බව නිරූපණය වන්නේ කුමක් ද? .....පුන්කලසින්..................
09. කරඬුව සහිත ඇතා, කස කරුවන් , ගිනි බෝල කරකවන්නන් ආදී දේ සහිත පෙළ සංස්කෘතික අංගය කුමක් ද? පෙරහැර
10. යුරෝපීය ඇඳුමට හිමිකම් කියන ජන වර්ගය කුමක් ද? .....බර්ගර්....ජනතාව...............
11. ශ්‍රී ලංකාවේ ලෝක උරුමයක් ලෙස සලකන වනාන්තරය නම් කරන්න. ..........සිංහරාජ....වනය.............
12. ඔසරිය සහ බෝරිච්චි අත් හැට්ටය අඳින කාන්තාවක් සහිත ජන වර්ගය නම් කරන්න. ...සිංහල....ජන....වර්ගය.
13. පරාටා , වටලප්පන් , හරක්මස් , ෆලූඩා වැනි ආහාර පාන තම අනන්‍ය ආහාර ලෙස සලකන ජන වර්ගය නම් කරන්න. ......මුස්ලිම්....ජන....වර්ගය.............
14. ශුද්ධ වූ බයිබලය තම ආගමික ග්‍රන්ථය ලෙස සලකන්නේ කුමන ආගමිකයින් ද? ..ක්‍රිස්තියානි....ආගමිකයින්...
15. 1815 උඩරට ගිවිසුමේ වගන්ති කියවා අවසන් කිරීමට පෙර එසවූ ඉංග්‍රීසි කොඩිය පහත හෙළා අප ජාතික කොඩිය නැවත එසවූ අභීත හිමි නම නම් කරන්න. වාරියපොළ....සුමංගල....හිමි (ලකුණු 02 x 15 = 30)

**පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම්**
**5 ශ්‍රේණිය**
**ගා/ සිරිධම්ම විද්‍යාලය**
**අපි ලක්වැසියෝ**

---

1. ජාතික කොඩියේ ඇති වර්ණ ගණන කීයද?
   (1) 4 කි (2) 7 කි (3) 5කි.

2. ජාතික කොඩියේ ජාතික අභිමානය පිළිඹිබු කරන්නේ,
   (1) කහ පැහැති (2) රතු පැහැති (3) තැඹිලි පාට

3. ජාතික කොඩියේ කහ පැහැති සිංහ රූපය මගින්,
   (1) මුස්ලිම් ජාතිය (2) දමිළ ජාතිය (3) සිංහල ජාතිය නියෝජනය

4. මුස්ලිම් ජාතිය නියෝජනය වන්නේ, ජාතික කොඩියේ,
   (1) කොළපාට (2) තැඹිලි පාට (3) කහපාට

5. ජාතික කොඩියේ සිංහයා අසිපත දරන්නේ,
   (1) දකුණු අතිනි (2) වම් අතිනි (3) පසුපස පාදයෙනි

6. ශ්‍රී ලංකාවේ රාජ්‍ය ලාංඡනය දැක ගත හැකි අවස්ථාවක් නොවන්නේ, මින් කුමක් ද?
   (1) කාසිවල (2) රාජ්‍ය ලියකියවිලිවල (3) මුදල් නෝට්ටුවල

7. රාජ්‍ය ලාංඡනයේ ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය පිළිබිඹු කරන්නේ, මින් කවරෙක් ද?
   (1) වී කරල් (2) පලාපෙති (3) ධර්මචක්‍රය

8. ශ්‍රී ලංකාවේ ජාතික පක්ෂියා,
   (1) ඇටි කුකුළා (2) වළිකුකුලා (3) මොනරා

9. ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ,
   (1) නෙලුම් (2) ~~නිල්~~ මානෙල් (3) ඕලු

10. ශ්‍රී ලංකාවේ ජාතික ශාකය වන්නේ,
    (1) පොල් (2) නා (3) බුරුත

11. උප්පැන්න සහතිකයක පිටපතක් ගැනීම සඳහා යා යුත්තේ,
    (1) ග්‍රාම නිලධාරී කාර්යාලයට (2) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට (3) රෝහලට

12. නිවාස ණයක් ලබා ගැනීමට යායුතු ස්ථානය වන්නේ, මින් කුමක් ද?
    (1) ප්‍රාදේශීය සභාව (2) බැංකුව (3) පන්සල

13. යම් අයෙකු මිය ගිය පසු එම මෘත දේහය ජලයෙන් නැහැවීම සිදු කරනු ලබන්නේ,

(1) හින්දු භක්තිකයන් (2) කිතුණු භක්තිකයන් (3) ඉස්ලාම් භක්තිකයන්

14. ශ්‍රී ලංකාවේ ජාතික ගීය නිර්මාණයේදී මුල් වූයේ,

(1) ආනන්ද සමරකෝන් මහතා (2) ටී.බී. ජායා මහතා (3) ඇස්. මහින්ද හිමි.

15. ලක්ෂ්මි දෙවගනට පුද පූජා පවත්වා සමෘද්ධිය ඉල්ලා සිටීමේ උත්සවය

(1) රාමසාන් (2) දීපවාලී (3) තෛපොංගල්

16. 1948 ජුලි 30 ගොංගාලේ ගොඩ බණ්ඩා තුන් සිංහලයේම රජු වශයෙන් ඔටුනු පළඳවා අභිෂේක කරන ලද නම,

(1) දාවිත් හෙවත් ඩේවිඩ්ය (2) දොන් පුල්ලේ වෙදරාල (3) ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි

17. මොනරවිල කැප්පෙටිපොල දිසාවගේ මව දෙල්වල එතනහාමි නම් විය, සහෝදරියගේ නම් වනුයේ,

(1) විශාකා සිටුදුව (2) ඇහැලේපොළ කුමාරිහාමි (3) රජ්ජුමාලා

18. යුද්දෙටත් ඇවිත් සිඳුපිට නැව් නැගිලා පරංගි............. යන ගීතය,

(1) මේවර කවියකි (2) ලී කෙළි කවි (3) හටන් කවි

19. කිතුණු බැතිමතුන් විසින් සමරනු ලබන ශෝක දිනයක් සහිත උත්සවය වන්නේ.

(1) නත්තල් (2) රාමසාන් (3) මහසිකුරාදා

20. සදාකාලික පැවැත්ම නිරූපණය කිරීම සඳහා රාජ්‍ය ලාංඡනයේ යෙදුණු සංකේතය වන්නේ,

(1) පලාපෙති (2) ඉර සහ හඳය (3) ධර්මචක්‍රය

21. ශ්‍රී ලංකාවේ ජාතික ක්‍රීඩාව වන වොලිබෝල් ක්‍රීඩාවේ එක පිලකට සිටින ( අතිරේක හැර) ක්‍රීඩකයන් ගණන වන්නේ,

(1) 6 කි . (2) 8 කි. (3) 12 කි.

22. ජාතික උරුමයන් ලෝක උරුමයන් බවට පත්වී ඇති දේවල් අතරින් ජය ශ්‍රී මහා බෝධිය, දළදා මාලිගාව, සීගිරිය, සිංහරාජ වනාන්තරය යන ස්ථානයි. ඒ අතරින් මිනිසාගේ වැඳුම් පිදුම් සඳහා ලක්වන ඇති ස්ථාන වනුයේ,

(1) සීගිරිය, සිංහරාජය (2) ජය ශ්‍රීමහා බෝධිය හා දළදා මාලිගය

(3) සිංහරාජ වනාන්තරය, සීගිරිය.

**ප්‍රාථමික සිසු දරු දැරියන්ගේ නිපුණතා පාදක අධ්‍යාපන ක්‍රියාවලිය සවිමත් කිරීම**

බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව

පරිසරය ආශ්‍රිත ක්‍රියාකාරකම් 5 ශ්‍රේණිය

2. අපි ලක් වැසියෝ

ප්‍රශ්න අංක 1 සිට 10 තෙක් ප්‍රශ්න සඳහා නිවැරදි පිළිතුර තෝරා යටින් ඉරක් අඳින්න.

01. ශ්‍රී ලාංකිකයන් වන අප ජාතියට ම අනන්‍ය නොවූවක් වන්නේ.

i. ජාතික ධජය ii. ජාතික ගීය iii. පාසල් ගීය

02. ශ්‍රී ලංකාව යනු,

i. බහු ජාතිකත්වයන් සහිත බහු ආගමික රටකි
ii. බහු ආගමික බහු සංස්කෘතික රටකි
iii. බහු ආගමික, බහු සංස්කෘතික බහු ජාතිකත්වයන් සහිත රටකි

03. ඉස්ලාම් භක්තිකයන්ගේ ආගමික සිද්ධස්ථානය හා සංකේතය වනුයේ.

i. පල්ලිය සහ අඩසඳ හා තරුව
ii. මස්ජිදය සහ අඩසඳ හා තරුව
iii. පල්ලිය සහ කුරුසය

04. "සඳ මඬලේ සිට තරු මඬලේ සිට දිවැස් හෙළන පුතුනේ" යන ගීතය ගායනා කරන්නේ.

i. නන්දා පතිරණ මහත්මිය
ii. මාලනී බුලත්සිංහල මහත්මිය
iii. නන්දා මාලනී මහත්මිය

05. "ලාක්ෂා" අමුද්‍රව්‍යයක් ලෙස යොදාගනිමින් කරනු ලබන්නේ.

i. ගල් කැටයම් කලාව ii. හස්ත කර්මාන්තය iii. වඩු කර්මාන්තය

06. ශ්‍රී වික්‍රම සර්ව සිද්ධි නමින් 1848 තුන් සිංහලයේ රජු බවට පත්වූයේ.

i. ගොංගාලේගොඩ බණ්ඩා ii. වීර පුරන් අප්පු iii. මද්දුම බණ්ඩාර


07. "යුද්දෙටත් ඇවිත් සිඳු පිට නැව් නැගිලා පරංගි" යන ගීය අයත් වන්නේ.

i. බයිලා ගීත වලට ii. පැරණි හටන් කාව්‍ය වලට iii. තොවිල් කවි වලට

08. පරිපාලන ආයතනයකි,

i. බැංකුව ii. පාසල iii. ප්‍රාදේශීය සභාව

09. පහත ආකාරයේ සටහනක් යොදාගනිමින් කරනු ලබන ක්‍රීඩාව වන්නේ.




i. පංච දැමීම

ii. බට්ටා පැනීම

iii. දාම් ඇදීම

10. අප රටේ ක්‍රීඩා ක්ෂේත්‍රයෙන් විශේෂ දක්ෂතා දැක්වූ පුද්ගලයෙක් වන්නේ.

i. සනත් විමලසිරි මහතා    ii. සනත් නන්දසිරි මහතා    iii. සනත් ජයසූරිය මහතා

පහත ප්‍රශ්න සඳහා පිළිතුරු දී ඇති තිත් ඉර මත ලියන්න.

11. අප රටේ ජීවත්වන ප්‍රධාන ජන කොටස් හතර නම් කර එක් එක් ජන කොටසේ ප්‍රධාන භාෂාව ද ඉදිරියෙන් ලියන්න.

සිංහල - සිංහල

දෙමළ - දෙමළ

මුස්ලිම් - දෙමළ

බර්ගර් - සිංහල

12. අප රටේ පවතින ලෝක උරුම බවට පත්ව ඇති ජාතික උරුමයන් 4ක් නම් කරන්න.

සීගිරිය

ජය ශ්‍රී මහා බෝධිය

දළදා මාලිගාව

සිංහරාජ වනාන්තරය

13. අප රටේ කලාව හා සංස්කෘතික උරුමයන් පරිහානියට බලපා ඇති කරුණු 4ක් ලියන්න.

නොසලකා හැරීම

හානිකර දේ කිරීම

අගය නොකිරීම

වටිනාකම් හඳුනා නොගැනීම

14. අතීතයේ දී අප රටට කීර්තියක් ගෙන ඒමට හේතු වූ ඔබ දන්නා කරුණු 4 ක් ලියන්න.

හෙළ වෙදකම

කැටයම් කලාව, පිළිම නෙළීම

ශාන්ති කර්ම

වෙස් මුහුණු කලාව, ජන ගී සහ ජන නැටුම්

15. ග්‍රාම නිලධාරී කාර්යාලය මගින් එහි සේවා ලාභීන්ට ඉටුවන සේවාවන් 3 ක් ලියන්න.

උප්පැන්න සහ මරණ සහතික අයදුම් පත් නිකුත් කිරීම

හැඳුනුම්පත් සඳහා තොරතුරු සහතික කිරීම

ඡන්ද හිමි නාම ලේඛන සකස් කිරීම

16. ඔබට සේවා සපයන රාජ්‍ය නිලධාරීන් තිදෙනෙක් නම් කර ඒ ඉදිරියෙන් ඔවුන්ගේ රාජකාරී ආයතනය ද ලියන්න.

උදාහරණය . ග්‍රාම නිලධාරි - ග්‍රාම නිලධාරි කාර්යාලය

ප්‍රාදේශීය ලේකම් තුමා - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

පොලිස් ස්ථානාධිපති තුමා - පොලීසිය

සභාපති තුමා - ප්‍රාදේශීය සභාව

පහත ප්‍රකාශ නිවැරදි නම් (√) ලකුණ ද වැරදි නම් (X) ලකුණ ද වරහන තුළ යොදන්න.

17. රටේ අනන්‍යතාව පිළිබිඹු වන අයුරින් කටයුතු කිරීම ශ්‍රී ලාංකික අපගේ යුතුකමකි. (√)

18. අංගම් පොර යනු ශ්‍රී ලාංකිකයන්ට ආවේණික නොවූවකි. (X)

19. ජාතියක් ලෙස අනන්‍යතාවකින් යුතු ලක්ෂණ සහිත සියල්ල ජාතික උරුම වේ. (√)

20. විවිධ ජාතිකත්ව අතර අවබෝධය ගොඩනැගීමට භාෂාවට හැකියාවක් නැත. (X)

21. කපුරුබස්ති බණ්ඩලාගේ ඩේවිඩ් ලෙස හැඳින්වූයේ අනගාරික ධර්මපාලතුමා ය. (X)

22. ඌව වෙල්ලස්ස කැරැල්ල මර්දනයට ඉංග්‍රීසීන් යෙදවූයේ කැප්පෙටිපොල දිසාවේ ය. (√)

23. මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි යනු රටේ නිදහස වෙනුවෙන් කැප වූ හිමිනමකි. (√)

24. ලෝකයක් නසන්නට රුදුරු අවි අත දරා - ගීතය ගයන්නේ සුනිල් ශාන්ත මහතා ය. (X)


25. අප රටේ ජාතික සත්ත්වයා වළිකුකුළා ය. (√)

26. ජාතික ධජයෙහි රතු පැහැති පසුබිමෙන් සිංහල ජනතාව නියෝජනය වේ. (X)

27. ජාතික උරුමයන් රැක ගනිමින් ආරක්ෂා කිරීමෙන් මානසික සුවයක් ලැබිය හැක. (√)

28. මී ගස් වැනි ශාක විදේශීය ආක්‍රමණිකයන් විනාශ කළේ සශ්‍රීකත්වය වැඩි කිරීමට ය. (X)

29. I. පහතින් දී ඇති ශ්‍රී ලංකා රාජ්‍ය ලාංඡනයෙහි අංක යොදා ඇති එක් එක් සංකේත නම් කර ඒවා මගින් නිරූපිත අදහස ද ලියන්න.





1. ධර්ම චක්‍රය - ධර්මය
2. වී කරල් - ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය
3. කඩුවක් අතින් ගත් සිංහයා - රට හා විනයගරුක ජනයා
4. පුන්කලස - සෞභාග්‍යය හා පරිපූර්ණ බව
5. ඉර හඳ - සදාතන පැවැත්ම

II. ඉහත රාජ්‍ය ලාංඡනයෙන් ප්‍රකාශිත සමස්ත අදහස කුමක් ද?

ස්වයංපෝෂිත රටක ඉරහඳ පවතින තෙක් ධර්මය ආරක්ෂා කරමින් මුළු මහත් ජනතාව වැජඹේ වා.

30. පහත රූපවල සිටින්නේ කවුරුන්දැයි දී ඇති හිස්තැනෙහි ලියන්න.



ඩී. එස්. සේනානායක මහතා



මිගෙට්ටුවත්තේ ගුණානන්ද හිමි



ඩබ්. ඩී. අමරදේව මහතා

# අපි ලක් වැසියෝ

(01) ගැළපෙන පිළිතුරු සොයා යා කරන්න.

| | |
|---|---|
| 1. ජාතික ගීය ගායනා කරන විට මෙසේ සිටිය යුතුයි. | කෝලම් සැරසිලි |
| 2. සිංහල ජාතීන්ට අනන්‍ය වූ ආහාරයකි. | තෝසෙ |
| 3. හින්දු භක්තිකයන් සමරන උත්සවයකි. | ආනන්ද සමරකෝන් මහතා ය. |
| 4. අප රටට නිදහස ලැබුණේ | සීරුවෙන් |
| 5. දමිළ ජාතිකයින්ගේ සැරසිලි වර්ගයකි. | රාමසාන් |
| 6. දෙමළ ජාතීන්ට අනන්‍ය වූ ආහාර වර්ගයකි. | ජාතික කොඩිය |
| 7. ජාතික ගීය රචනා කළේ | කිරිබත් |
| 8. ප්‍රසිද්ධ ගත් කතුවරයෙකි. | මහා ශිව රාත්‍රී |
| 9. ඉස්ලාම් භක්තිකයින් සමරන උත්සවයකි. | 1948 .02.04 දිනය |
| 10. ජාතික නිදහස් දිනයේ දී බොහෝ නිවෙස්වල ඔසවයි. | මාර්ටින් වික්‍රමසිංහ මහතා |

(02) හිස්තැන් සම්පූර්ණ කරන්න.


| | ආගම | ශාස්තෘන්වහන්සේ | ආගමික ස්ථානය | ආගමික ලාංඡනය |
|---|---|---|---|---|
| 1. | බෞද්ධ | බුදුන් වහන්සේ | පන්සල | ධර්ම චක්‍රය |
| 2. | ක්‍රිස්තියානි | ජේසුස් වහන්සේ | පල්ලිය | කුරුසය |
| 3. | ඉස්ලාම් | නබි නායක තුමා | මස්ජිදය | අඩසඳ හා තරුව |
| 4. | හින්දු | ශිව දෙවියන් | කෝවිල | ත්‍රිශූලය |

(03) නිවැරදි පිළිතුර තෝරා හිස්තැන මත ලියන්න.

(ගොක් කොළ, මරතොණ්ඩි, නිදහස් දින, කටුව හැංගීම, ගරු, මාලනී බුලත්සිංහල, ඩන්කන් වයිට්, වටලප්පන්)

1. ..කටුව හැංගීම.. ලක්වැසියන් අතර ප්‍රචලිත ජන ක්‍රීඩාවකි.
2. ශ්‍රී ලංකාවට පළමුවන ඔලිම්පික් පදක්කම ගෙන ආවේ ....ඩන්කන් වයිට්.... මහතා ය.
3. ....වටලප්පන්..... මුස්ලිම් ජාතීන්ට අනන්‍ය වූ ආහාරයකි.
4. මුස්ලිම් හා දෙමළ ජාතීහු තම අත්ල යොදා ගනිමින් ...මරතොණ්ඩි.. සැරසිලි කරති.
5. "මේ රට මගෙ රට මා ඉපදුණු රට" .................... ගීතය ගායනය කරන්නේ මාලනී බුලත්සිංහල මහත්මියයි.
6. ..නිදහස් දින..... උත්සවය ශ්‍රී ලාංකිකයන් සමරන ජාතික උත්සවයකි.
7. සිංහල ජාතිකයෝ විවිධ උත්සව අවස්ථාවන්හි දී අලංකාර ...ගොක් කොළ.... සැරසිලි කරති.
8. ශ්‍රී ලාංකිකයින් ලෙස එක් ව ජීවත් වීමේ දී අප සියලු ආගම්වලට හා ජාතීන්ට .....ගරු............... කළ යුතුය.

(04) දී ඇති තොරතුරු අනුව ජාතික කොඩිය නියමිත වර්ණවලින් පාට කරන්න.




(05) ජාතික කොඩිය හා සම්බන්ධ පහත ප්‍රකාශ නිවැරදි නම් (✓) ලකුණ ද වැරදි නම් (✕) ලකුණ ද වරහන් තුළ යොදන්න.

1. ජාතික කොඩිය අනෙකුත් සියලු කොඩිවලට වඩා ඉහළින් එසවිය යුතුය. ( ✓ )
2. ජාතික කොඩිය රටේ ජනතාවගේ අනන්‍යතාවය පෙන්නුම් කරන ප්‍රධාන සංකේතයකි. ( ✓ )
3. ජාතික ගීය ගායනා කරනුයේ ජාතික කොඩිය එසවීමට පෙර ය. ( ✗ )
4. ජාතික ශෝක දිනවල දී ජාතික කොඩිය අඩකුඹු කරයි. ( ✓ )
5. ජාතික කොඩියේ දිග හා පළල ප්‍රමාණයෙන් එක සමාන ය. ( ✗ )

(06) පිළිතුරු ලියන්න.

1. ජාතික කොඩිය ඔසවනු ලබන අවස්ථා තුනක් ලියන්න.

   i. ජාතික උත්සව වලදී

   ii. රාජ්‍ය උත්සව වලදී

   iii. රාජ්‍ය නායක සමුළු වලදී


2. රාජ්‍ය ලාංඡනය ප්‍රදර්ශනයවන අවස්ථා තුනක් ලියන්න.

   i. රාජ්‍ය ආයතන වල

   ii. රියදුරු බලපත්‍ර වල

   iii. ජාතික හැඳුනුම්පතේ

(07) රාජ්‍ය ලාංඡනයේ ඇති සංකේත නිවැරදි ව පිහිටුවා ඇති ස්ථාන හඳුනාගෙන ඒවා මොනවාද යි වරහන් තුළින් තෝරා අංක ඉදිරියෙන් ලියන්න.



1. ධර්ම චක්‍රය
2. පළාපෙති
3. වී කරල්
4. ඉර
5. හඳ
6. සිංහයා
7. පුන්කලස

(පලාපෙති, කඩුව රැගත් සිංහයා, වී කරල්, ධර්මචක්‍රය, පුන්කලස, ඉර, සඳ)

(08) රාජ්‍ය ලාංඡනයෙන් කියැවෙන සමස්ත අදහසට අනුව නියමිත වචන යොදමින් හිස්තැන් සම්පූර්ණ කරන්න.

"ස්වයං පෝෂිත රටක ....ඉර හඳ.... පවතින තෙක් ....ධර්මය.... ආරක්ෂා කරමින් මුලු මහත් ....ජනතාව.... වැජඹේවා."

(09) රාජ්‍ය ලාංඡනයේ සංකේතවලින් ප්‍රකාශිත නිවැරදි අදහස කොටුව තුළින් තෝරා හිස්තැන මත ලියන්න.

1. පුන්කලස ....සෞභාග්‍යය හා පරිපූර්ණ බව....
2. වී කරල් ....ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය....
3. ධර්ම චක්‍රය ....සදාතන පැවැත්ම....
4. ඉර හා හඳ ....ධර්මය....
5. කඩුවක් අතින් ගත් පලාපෙති වටය මැද සිංහයා ....රට හා විනයගරුක ජනයා....

ධර්මය / සදාතන පැවැත්ම / සෞභාග්‍යය හා පරිපූර්ණ බව / රට හා විනය ගරුක ජනයා / ස්වයංපෝෂිත බව හා සශ්‍රීකත්වය

(10) අප රටේ අභිමානය වෙනුවෙන් භාවිත කරන ජාතික සංකේත හඳුනාගෙන නම් කරන්න.



i. ....වොලිබෝල්....



ii. ....මානෙල්....



iii. නා



iv. වලිකුකුළා

(11) නිවැරදි පිළිතුර තෝරා අංකය රවුම් කරන්න.

1. අප රටේ ජාතික ක්‍රීඩාවේ එක් පිලකට සිටිය යුතු ක්‍රීඩකයින් සංඛ්‍යාව
   1. 7 කි. 2. 11 කි. (3.) 6 කි.
2. වෙල් පෙරහැර පවත්වනු ලබන ආගමික භක්තිකයින් වන්නේ,
   1. ඉස්ලාම් (2.) හින්දු 3. බෞද්ධ
3. ලංකාවේ සියලු ම ආගමික ජනතාව වන්දනා කරන පුදබිමකි.
   (1.) ශ්‍රී පාදස්ථානය 2. අනුරාධපුරය 3. කැලණිය
4. අපට සේවා සපයන රාජ්‍ය ආයතනයකි.
   1. ඇගලුම් කම්හල
   (2.) ප්‍රාදේශීය ලේකම් කාර්යාලය
   3. සුපිරි වෙළඳසැල
5. ක්‍රි.ව. 1815 දී ලංකාව බ්‍රිතාන්‍යයන්ට යටත් වූ පසු නිදහස වෙනුවෙන් උදාර සේවයක් කළ අයෙකි.
   (1.) වීර පුරන් අප්පු
   2. ආනන්ද කුමාරස්වාමි
   3. මාර්ටින් වික්‍රමසිංහ මහතා
6. "ලොවේ සැමා එකම දූයේ - දූ දරුවන් වේවා" යන ගීතයෙන් කියවෙන සමස්ත අදහස වන්නේ,
   1. දේශාභිමානය මතුවීම
   (2.) සියලු ජනවර්ග එකමුතුව කටයුතු කිරීම
   3. පරිසර අලංකරණය පිළිබඳව.

(12) පහත දැක්වෙන ජනවර්ග හඳුනාගෙන නම් කරන්න.

1




දෙමළ

2




සිංහල

3



මුස්ලිම්

4



බර්ගර්

(13) ලංකාවේ වෙසෙන විවිධ ජන කොටස් සම්බන්ධ ව ලබා දී ඇති තොරතුරු ඇසුරෙන් පහත වගුව සම්පූර්ණ කරන්න.

පරාටා , ධර්ම චක්‍රය , වේට්ටිය හා බැනියම , කේක් , ඔසරිය , ත්‍රිශූලය , මුරුක්කු , බුරියානි , ගවලෙන , කඨින පිංකම් , කිරිබත් , පුඩිං , කුරුසය , ජාතික ඇඳුම , කෝලම් රටා , පර්දාව , තෝසේ , අඩ සඳ හා තරුව, දීපවාලි, කැරොල් ගීත

| i. සිංහල බෞද්ධ | ii. දෙමළ | iii. මුස්ලිම් | iv. බර්ගර් |
|---|---|---|---|
| ධර්ම චක්‍රය | වේට්ටිය හා බැනියම | පරාට | කේක් |
| ඔසරිය | ත්‍රිශූලය | බුරියානි | ගවලෙන |
| කඨින පිංකම් | මුරුක්කුතෝසෙ | පර්දාව | පුඩිං |
| කිරිබත් | කෝලම් රටා | අඩ සඳ හා | කුරුසය |
| ජාතික ඇඳුම | දීපවාලි | තරුව | කැරොල් ගීත |

(14) පහත දැක්වෙන ආගම්වලට අයත් ආගමික උත්සව දෙක බැගින් ලියන්න.

1. බෞද්ධ - වෙසක්, ඇසළ
2. හින්දු - දීපාවලි, තෛයිපොංගල්
3. ඉස්ලාම් - රාමසාන්, හජ්ජි
4. ක්‍රිස්තියානි - නත්තල්, අළු බදාදා

(15) සුදුසු පරිදි යා කරන්න.

1. පෙරදිග මුතු ඇටයයි මේ....
2. රත්නදීප ජන්ම භූමි.....
3. ලංකා ලංකා පෙම්බර ලංකා....
4. මේ සිංහල අපගෙ රටයි....
5. හෙළ ජාතික අභිමානේ....
6. 'මගේ රට' කවි පන්තිය....

- නන්දා මාලනී මහත්මිය
- පී.බී.අල්විස් පෙරේරා මහතා
- සුනිල් ශාන්ත මහතා
- ලතා වල්පොල මහත්මිය හා ධර්මදාස වල්පොල මහතා
- ඩබ්.ඩී.අමරදේව මහතා
- සී.ටී.ප්‍රනාන්දු මහතා

(16) ගැළපෙන ලෙස යා කරන්න.

1. කිරිබත්
2. බුරියානි
3. ෆයිඩ්රයිස්
4. දඩ මස්
5. මී පැණි
6. කේක්
7. වඩේ
8. වටලප්පන්
9. තෝස
10. ඉට්ලි

A. ආදිවාසි ජනතාව
B. සිංහල ජනතාව
C. දමිළ ජනතාව
D. බර්ගර් ජනතාව
E. මුස්ලිම් ජනතාව

(17) ඒ ඒ ජාතීන්ට ගැළපෙන සංස්කෘතික අංග තෝරා එහි අංක ඊට අදාළ කොටුව තුළ ලියන්න.

1. සිකුරාදාට පල්ලි යාම
2. කිරි කොරහ නැටීම.
3. නත්තල් සැමරීම
4. කෝලම් රටා ඇඳීම.
5. සුබ කටයුතුවලදී පිරිත් කීම.
6. කිරිවලින් දේවරූප නෑවීම.

| | | |
|---|---|---|
| 1. | සිංහල - | 5 |
| 2. | දමිළ - | 4, 6 |
| 3. | මුස්ලිම් - | 1 |
| 4. | බර්ගර් - | 3 |
| 5. | ආදිවාසීන් | 2 |

(18) A කොටසට ගැළපෙන පිළිතුර B කොටසින් තෝරා යා කරන්න.

A

1. ආදිවාසීන් වැඩිපුර වෙසෙන්නේ
2. බුදුරජාණන් වහන්සේගේ වම් දළදා වහන්සේ තැන්පත් කොට ඇත්තේ
3. ත්‍රිපිටකය ග්‍රන්ථාරූඪ කළේ
4. නිදහස් සටනේ ප්‍රධානතම සෙන්පතියෙක් වන්නේ
5. ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති ලෙස හඳුන්වන්නේ

B

a. ඩී.එස් සේනානායක මහතා ය.
b. මහියංගනය ප්‍රදේශයේ ය.
c. මාතලේ අලු විහාරයේ දී ය.
d. ගොංගාලේගොඩ බණ්ඩා ය.
e. මහනුවර දළදා මාලිගාවේ ය.

(19) හිස්තැනට ගැළපෙන පිළිතුර වරහන් තුළින් තෝරා ලියන්න.

(මීගස, සිංහරාජ වනාන්තරය, කැටයම්, අම්බලන්ගොඩ, මධ්‍යම)

1. සිංහරාජ..වනාන්තරය ලෝක උරුමයක් වේ.
2. දළදා මාලිගය පිහිටි පළාත වන්නේ .........මධ්‍යම......... පළාත ය.
3. රූකඩ සඳහා .....අම්බලන්ගොඩ..... ප්‍රදේශය ප්‍රසිද්ධ ය.
4. ..........මී ගස.......... පස සරු කිරීම සඳහා බොහෝ සේ උපකාරී වේ.
5. ගොක් කොළ, ලී සහ කඩදාසි .......කැටයම්....... කලාව සඳහා උපයෝගී කර ගනියි.

(20) පහත වගන්ති හරි නම් (✓) ලකුණ ද වැරදි නම් (✗) ලකුණ ද යොදන්න.

1. කෙම්ක්‍රම, ශාන්ති කර්ම මගින් ලෙඩ රෝග සුව කිරීම අප රටේ අතීතයේ සිට පැවත එන්නකි. ( ✓ )
2. ඇම්බැක්කේ ලී කැටයම්වලට ප්‍රසිද්ධ ය. ( ✓ )
3. සද්ධාතිස්ස රජු විසින් රුවන්වැලි සෑය කරවන ලදී. ( ✗ )
4. අංගම් පොර ශ්‍රී ලංකාවේ අතීතයේ සිට පැවත එන සටන් කලාවකි. ( ✓ )
5. ඉඳි, තල්කොළ, පොල් ඉරටු, පන්, හස්ත කර්මාන්තය සඳහා යොදා ගනියි. ( ✓ )
6. "සඳමඬලේ සිට තරු මඬලේ සිට දිවැස් හෙළන පුතුනේ" ගීය ගායනා කරන්නේ අයිවෝ ඩෙනිස් මහතා ය. ( ✗ )

(21) පහත සඳහන් ආයතනවලින් සිදුවන සේවාවන් හඳුනාගෙන ඊට අදාළ ඉංග්‍රීසි අක්ෂරය වරහන තුළ යොදන්න.

A - නගර සභාව

B - ප්‍රාදේශීය ලේකම් කාර්යාලය

C - ග්‍රාම නිලධාරී කාර්යාලය

1. උප්පැන්න මරණ සහතික ලියාපදිංචි කිරීම. ( B )
2. ජාතික හැඳුනුම්පත් සකස් කිරීම සඳහා තොරතුරු ලබා ගැනීම. ( C )
3. කුණු කසළ නිසි අයුරින් බැහැර කිරීම. ( A )
4. වාහන ආදායම් බලපත්‍රය අලුත් කිරීම ( B )
5. ඡන්ද පත්‍රිකා නිවෙස්වලට බෙදා හැරීම. ( C )
6. ගෙවත්තේ ඇති කොස් ගසක් කැපීමට බලපත්‍රයක් ලබා දීම. ( B )

(21) ජාතික කොඩියේ රතු පැහැති පසුබිමෙන් අදහස් වන්නේ,
(i) ජාතික අභිමානය (ii) සිංහල ජාතිය (iii) සිංහල ජාතියේ නිර්භීතකම

(22) රාජ්‍ය ලාංඡනයේ දක්නට නොලැබෙන දෙයක් වන්නේ,
(i) කඩුව අතින් ගත් සිංහයා (ii) පලාපෙති (iii) බෝ කොළ සතර

(23) ශ්‍රී ලංකාවේ ජාතික පුෂ්පය වන්නේ,
(i) නා මල (ii) මානෙල් මල (iii) මානෙල්

(24) උකුසු හාමි බොහෝම ඉහළ - මුව පැටියෙක් ඇල්ලුවා යන ක්‍රීඩාවේ රවුමේ මැද සිටින්නේ,
(i) උකුස්සා (ii) මුව පැටියා (iii) හා පැටියා

(25) ශ්‍රී ලංකාව ඉංග්‍රීසින්ට මුළුමනින්ම යටත් වූ වර්ෂය වන්නේ,
(i) 1948 (ii) 1815 (iii) 1915

(26) දමිල ජාතිකයින්ට අයත් ආහාර වර්ගයක් නොවන්නේ,
(i) තෝසේ (ii) ඉට්ලි (iii) ලම්ප්‍රයිස්

(27) ශ්‍රී ලංකාව ආක්‍රමණය කිරීමට පැමිණි විදේශීය ජාතීන් පැමිණි පිළිවෙළින් සඳහන් පිළිතුර වන්නේ,
(i) ඉංග්‍රීසීන්, පෘතුගීසීන්, ලන්දේසීන් (ii) පෘතුගීසීන්, ලන්දේසීන්, ඉංග්‍රිසීන්
(iii) ලන්දේසීන්, පෘතුගීසීන්, ඉංග්‍රිසීන්

(28) උප්පැන්න සහතිකයේ පිටපතක් ලබා ගැනීම සඳහා යා යුතු වන්නේ,
(i) ප්‍රාදේශීය සභාවට ය (ii) ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ය (iii) පොලිසියට ය

(29) බට්ටා පැනීමේ ක්‍රීඩාවේ දී අඳිනු ලබන කොටු ගණන වන්නේ,
(i) 6 කි (ii) 7 කි (iii) 8 කි

(30) නිදහස් ශ්‍රී ලංකාවේ ප්‍රථම අගමැති වන්නේ,
(i) ජේ. ආර්. ජයවර්ධන මැතිතුමා (ii) සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනිය
(iii) ඩී. එස්. සේනානායක මැතිතුමා

(31) පොඩි කළ විට සුවඳ දැනෙන ශාක පත්‍රයක් වන්නේ,
(i) බිලිං (ii) කරපිංචා (iii) කොස්

(32) ශක්තිමත් කඳක් ඇති ශාකයකි.
(i) කොස් (ii) කරපිංචා (iii) කතුරුමුරුංගා

අප උපකාරක පංතියේදී ලබා දෙන මෙම නිබන්ධනය ද ඇතුලු මෙවැනි නිබන්ධන රාශියක් pdf ලෙස 3in1 Group එකෙන් ලබා ගත හැක.

සුවහසක් ශිෂ්‍යත්ව විභාගයට පෙනී සිටින දරුවන් වෙනුවෙන් වාණිජ අරමුණකින් තොරව සතුටින් ලබා දෙන නිබන්ධන නම වෙනස් කර අලෙවි කිරීමට කටයුතු නොකරන්න. පාසල් හෝ උපකාරක පංති සඳහා යොදා ගත හැකිය. ඔබ විසින් ලබා දෙන Like එක Comment එක අපට ශක්තියකි.


අප 3in1 Youtube නාලිකාවෙන් ප්‍රශ්න පත්‍ර සඳහා පිළිතුරු සාකච්ඡා කිරීම නැරඹිය හැකිය.


ස්තුතියි !


හසිත හෙට්ටිආරච්චි

(Dip. In Sci. N.I.E./O.U.S.L.)





3 in 1 youtube නාලිකාව ඔස්සේ නැරඹිය හැකිය.

Online Class details – WhatsApp 071 – 9020298 Facebook 3in1 Youtube 3in1

එක් කණ්ඩායමකට සිසුන් 10ක් පමණක් බඳවා ගැනේ